## අයදුම්පත් කැඳවීමේ නිවේදනය

**දීප ව්‍යාප්තව පුරප්පාඩු පවතින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිවිධාන වලට අනුකූලව නිලධාරීන් තෝරා ගැනීම**

පුරප්පාඩු පවත්නා ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය තීරණය කර ඇත.

2023/05/03 දින වන විට පුරප්පාඩු සංඛ්‍යාව 22 ක් වන අතර එම පුරප්පාඩු පිරවීම සඳහා මෙම අයදුම්පත් කැඳවනු ලැබේ. (පුරප්පාඩු ලේඛනය ඇමුණුම 02 ලෙස අමුණා ඇත)

පුරප්පාඩු වී ඇති ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා සුදුසුකම්ලත් I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති අවස්ථාවලදී, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සතුටුදායක හා සක්‍රියව වසර 06 ට වඩා වැඩි කාලයක් සේවය කර ඇති (2015/01/01 දිනට පෙර ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගන්නා ලද) II ශ්‍රේණියේ නිලධාරීන් එම පුරප්පාඩු තනතුරුවල පූර්ණකාලීනව රාජකාරී ඉටු කිරීමට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

පූර්ණකාලීනව රාජකාරී ඉටු කිරීමට පත් කරනු ලබන නිලධාරීන් එම තනතුරට පත් කරනු ලබනුයේ උපරිම අවුරුද්දක කාල සීමාවකට වන අතර එම කාලය දීර්ඝ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 121 ප්‍රකාරව සිදු කෙරේ.

පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් ඇමුණුම 01 පරිදි සකස් කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිල මැදුර, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනය වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2023/05/20 දිනට ප්‍රථම යොමු කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක්ද නියමිත දිනට ප්‍රථම diviaddivision@gmail.com විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත ආකෘතියෙන් ඉදිරිපත් නොකරන අයදුම්පත් කිසිදු දැනුම් දීමක් නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 2.0. අයදුම්කරුගේ සුදුසුකම්

අයදුම්කරන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට අමතරව පහත සුදුසුකම් සපුරා තිබීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වේ.

#### 2.1. සේවා පළපුරුද්ද

i. ප්‍රාදේශීය පාලනය සහ එහි කාර්යභාරය පිළිබඳ මනා අවබෝධයක් තිබීම
ii. ප්‍රාදේශීය පාලනය හා සම්බන්ධ වන සේවා හෝ ඒ ආශ්‍රිත අධ්‍යයන සුදුසුකම් හදාරා තිබීම

#### 2.2. වෘත්තීය සුදුසුකම්/ පුහුණු/ භාෂා ප්‍රවීනතා

i. ප්‍රාදේශීය පාලනය සම්බන්ධ පශ්චාත් උපාධි
ii. ප්‍රාදේශීය පාලනය හා සම්බන්ධ පුහුණු පාඨමාලා
iii. භාෂා ප්‍රවීනතා

**2.3. ශක්තීන්**

i. විශ්ලේෂනාත්මක හැකියාව
ii. අභියෝග භාර ගැනීමට ඇති කැමැත්ත
iii. ප්‍රාදේශීය පාලනය සම්බන්ධයෙන් වන දැනුම සහ අවබෝධය

**2.4. චර්යාත්මක නිපුණතා**

i. නායකත්වය සහ පෞරුෂය
ii. සන්නිවේදන කුසලතාවයන්
iii. සංවර්ධනාත්මක වෙනස්කම් ඇති කිරීමට ඇති කැමැත්ත

**3.0. තනතුරු සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය**

තනතුරු සඳහා තෝරාගැනීමේදී ලකුණු ලබා දීම ප්‍රධාන අදියරයන් 02 ක් යටතේ සිදුවේ.

**I අදියර - අයදුම්පතෙන් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සලකා බැලීම සහ ලකුණු ප්‍රදානය**

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන් නියමිත ආකෘතිය ප්‍රකාරව යොමු කර ඇති අයදුම්පත් වල ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව පහත ක්ෂේත්‍රයන් සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙනු ඇත.

i. ජ්‍යෙෂ්ඨත්වය
ii. අදාළ ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද
iii. වෘත්තීය සුදුසුකම්

**II අදියර - සම්මුඛ පරීක්ෂණය මගින් ලකුණු ප්‍රදානය**

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රධාන පහත ශීර්ෂ යටතේ ලකුණු ලබාදෙනු ඇත.

iv. නිලධාරියාගේ ශක්තීන්
v. නිලධාරියාගේ චර්යාත්මක දක්ෂතා

අයදුම්පත් කැඳවීමේ ක්‍රමවේදය අනුව ජ්‍යෙෂ්ඨත්වය හා ඉදිරිපත් කරන ලද අයදුම්පතෙහි ලකුණු පටිපාටිය අනුව තෝරාපත් කර ගත් බාණ්ඩ ගත නිලධාරීන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

## 3.1. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය

| අනු අංකය | ලකුණු ලබා දීමේදී සලකා බැලෙන නිර්ණායක | උපරිම ලකුණු | මුළු ලකුණු | ඇගයීමට පාදක වන ක්‍රමවේදය |
|---|---|---|---|---|
| I. | **ජ්‍යෙෂ්ඨතාවය**<br>ජ්‍යෙෂ්ඨතම සුදුසුකම්ලත් අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී, අනෙකුත් අයදුම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට ඊට සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ. මෙහිදී එක් එක් අයදුම්කරුවන්ගේ "සතුටුදායක සේවා කාලය" පමණක් සලකනු ලැබේ | 50 | 50 | අයදුම්පත |
| II. | **සේවා පළපුරුද්ද**<br>ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ තනතුරක සේවය කර තිබීම<br>- ප්‍රාදේශීය පාලනයේ සේවය කර තිබීම හෝ ග්‍රාමීය සංවර්ධනය, කුඩා කර්මාන්ත සංවර්ධනය, සමාජ සේවා කාර්යයන් වැනි ක්ෂේත්‍රවල නිලධාරියෙකු ලබා ඇති පළපුරුද්ද ප්‍රාදේශීය පාලනයට අදාළ කර ගත හැකි වනු ඇත. | 20 | 20 | අයදුම්පත |
| III. | **වෘත්තීය සුදුසුකම්**<br>අධ්‍යාපන සුදුසුකම්<br>සේවා ව්‍යවස්ථාව අනුව අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම්<br>- පර්යේෂණ පාදක පශ්චාත් උපාධියකට - ලකුණු 07<br>- පාඨමාලා පාදක පශ්චාත් උපාධියකට - ලකුණු 06<br>- පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 04<br>- පශ්චාත් උපාධි සහතික පත්‍ර - ලකුණු 02<br>ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වන/ අදාළ වන පුහුණු පාඨමාලා<br>- මාස 03 හෝ ඊට වැඩි කාලයක - ලකුණු 01<br>- දවස් 10 හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.5<br>- දවස් 03 ක් හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.2<br>භාෂා ප්‍රවීණතාවය<br>- පිළිගත් විශ්වවිද්‍යාලයකින්/රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමාවක්/ IELTS (Academic) මුළු ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL- IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ, හෝ TOEFL- PBT 550 හෝ ඊට ඉහළ - ලකුණු 02<br>- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකයක් - ලකුණු 01<br>සලකුණු කර ඇති ශීර්ෂ යටතේ ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 07<br>01<br>02 | 10 | අයදුම්පත |
| IV. | **ශක්තීන්**<br>- විශ්ලේෂණාත්මක හැකියාව<br>- අභියෝග භාර ගැනීමට ඇති කැමැත්ත<br>- ප්‍රාදේශීය පාලනය හා සම්බන්ධ වන දැනුම | 10 | 10 | සම්මුඛ පරීක්ෂණය |
| V. | **චර්යාත්මක නිපුණතා**<br>- නායකත්ව ගුණාංග<br>- සන්නිවේදන කුසලතාවය<br>- සංවර්ධනාත්මක වෙනස්කම් ඇති කිරීම | 10 | 10 | සම්මුඛ පරීක්ෂණය |
| VI. | **විනය ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් ලකුණු අඩුවෙනු ලැබේ** | -25 | -25 | |
| | මුළු ලකුණු | | **100** | |

උක්ත සඳහන් පරිදි අයදුම්පත්‍රයේ සඳහන් සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේ සුදුසුකම් අනුව වැඩිම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අදාළ තනතුරු වලට පත් කෙරෙනු ඇත.

පුරප්පාඩු සඳහා තෝරා ගන්නා නිලධාරීන් සමාන ලකුණු ලබා ගන්නා අවස්ථාවන් හිදී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්ති ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ලේකම් විසින් තීරණය කරනු ඇත.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, ස්වදේශ කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන) ඩබ්ලිව්.පී.සී.ඒ. වීරසූරිය මහතා (දුරකතන අංකය - කාර්යාලය 011-2050360, 071- 4491764) සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

**කේ.ඩී.එන්. රංජිත් අසෝක**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දිනය: 2023 මැයි මස 03 දින